(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 49.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2019 මාර්තු 29 වැනි සිකුරාදා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යතුමිය

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා

ගරු **තිලක් මාරපන මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මංගල සමරවීර මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජේ. සී. අලවතුවල මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රංජිත් අලුවිහාරේ මහතා,** සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලකී ජයවර්ධන මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අජිත් මාන්නප්පෙරුම මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍ය

ගරු **රන්ජන් රාමනායක මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වඩිවේල් සුරේෂ් මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් බණ්ඩාර ජයමහ මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා,** සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**

ගරු **මහින්ද අමරවීර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා

ගරු ටී. බී. ඒකනායක මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු පියසේන ගමගේ මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු එස්. බී. නාවින්න මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු මුහම්මදු නසීර් මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා

ගරු සුජීත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු පාලිත රන්ගේ බණ්ඩාර මහතා

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා

ගරු ෆයිසර් මුස්තාපා මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජීබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු ධුලිප් විජේසේකර මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

ගරු මහින්ද සමරසිංහ මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු රංජිත් සියඹලාපිටිය මහතා

ගරු තිලංග සුමතිපාල මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු වසන්ත සේනානායක මහතා

ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා

ගරු මාවෙෙ සෝ. සේනාධිරාජා මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු විජිත් විජයමුණි සොයිසා මහතා

ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා

**ගරු කනක හේරත් මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

**ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජනවාරි 03 දිනැති අංක 2104/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 පෙබරවාරි 01 දිනැති අංක 2108/65 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 පෙබරවාරි 07 දිනැති අංක 2109/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 පෙබරවාරි 08 දිනැති අංක 2109/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 පෙබරවාරි 24 දිනැති අංක 2111/58 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vi) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 02 දිනැති අංක 2112/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vii) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 පෙබරවාරි 28 දිනැති අංක 2112/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය; සහ

(viii) (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් වූ යෝජනාව

(2019 මාර්තු 05 දිනැති අංක 2113/2 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

පිළිගන්වා, එම නියමයන්, නියෝගය සහ යෝජනාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අගෝස්තු 14 දිනැති අංක 2084/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පිළිගන්වා, එම නියමය ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. කාරක සභා වාර්තා පිළිගැන්වීම** : රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින්, එම කාරක සභාව විසින් සකස් කරන ලද 2019 අයවැය හි රාජ්‍ය මුදල්, මූල්‍ය සහ ආර්ථික උපකල්පන පිළිබඳ ඇගයීම සම්බන්ධයෙන්වූ එම කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

3**. මහජන පෙත්සම් පිළිගැන්වීම :**

මොරොන්තුඩුව, මහගෝනදූව, අංක 110 දරන ස්ථානයෙහි පදිංචි කේ. ආරියවතී පීරිස් මහත්මියගෙන් ලැබුණු 2017.11.11 දිනැති පෙත්සම ගරු අජිත් පී. පෙරේරා මහතා විසින් පිළිගන්වන ලදී

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්න :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,—පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2019 මාර්තු 27 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන යටතේ ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. විසර්ජන පනත් කෙටුම්පත — (විසිවැනි වෙන් කළ දිනය) :** කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.

(කාරක සභාවේදී)

නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.

ශීර්ෂය 117

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා ඉදිරිපත් කළ යෝජනාව,— "වැඩසටහන රුපියල් 10/- කින් අඩු කළ යුතුය".

(පූ.භා. 11.38 ට ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 2.03 ට ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 3.12 ට ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 3.41 ට ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 5.23 ට ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 6.39 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ශීර්ෂය 117 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 379,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව මතු පළවන අන්දමට - පක්ෂව 84; විරුද්ධව 01; යනුවෙන් බෙදී සභා සම්මත විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ආ) අනුකූලව විද්‍යුත් ඡන්ද විමසීම් ක්‍රමය භාවිතයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් අසූ දෙනෙකු (80) දෙනෙකු පහත සඳහන් ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී.

| | |
|---|---|
| O 018. Mavai S. Senathirajah | Yes |
| O 021. Selvam Adaikkalanathan | Yes |
| O 084. Ananda Aluthgamage | No |
| O 099. Gnanamuthu Srineshan | Yes |
| G 001. Rauff Hakeem | Yes |
| G 002. Mangala Samaraweera | Yes |
| G 004. John Amaratunga | Yes |
| G 005. Gayantha Karunatileka | Yes |
| G 006. Lakshman Kiriella | Yes |
| G 009. Tilak Marapana | Yes |
| G 010. Wajira Abeywardana | Yes |
| G 011. Ravi Karunanayake | Yes |
| G 012. Rajitha Senaratne | Yes |
| G 014. Patali Champika Ranawaka | Yes |
| G 015. Kabir Hashim | Yes |
| G 017. Akila Viraj Kariyawasam | Yes |

| | |
|---|---|
| G 018. Malik Samarawickrama | Yes |
| G 019. Mano Ganesan | Yes |
| G 021. J.M. Ananda Kumarasiri | Yes |
| G 022. P. Harrison | Yes |
| G 023. R.M. Ranjith Madduma Bandara | Yes |
| G 024. Arjuna Ranatunga | Yes |
| G 026. Chandrani Bandara | Yes |
| G 027. Thalatha Atukorale | Yes |
| G 028. Abdul Haleem | Yes |
| G 031. Daya Gamage | Yes |
| G 033. Sujeewa Senasinghe | Yes |
| G 034. Harsha De Silva | Yes |
| G 035. Ajith P. Perera | Yes |
| G 036. V. Radhakrishnan | Yes |
| G 037. Ruwan Wijayawardene | Yes |
| G 038. Lucky Jayawardana | Yes |
| G 042. A.D. Premadasa | Yes |
| G 043. Wasantha Aluwihare | Yes |
| G 044. Vijayakala Maheswaran | Yes |
| G 045. Eran Wickramaratne | Yes |
| G 047. J.C. Alawathuwala | Yes |
| G 050. Ranjan Ramanayake | Yes |
| G 051. Ashok Abeysinghe | Yes |
| G 052. H.M.M. Harees | Yes |
| G 053. Seyed Ali Zahir Moulana | Yes |
| G 054. Ajith Mannapperuma | Yes |
| G 055. Edward Gunasekara | Yes |
| G 056. Anoma Gamage | Yes |
| G 057. Karunarathna Paranawithana | Yes |
| G 059. Nalin Bandara Jayamaha | Yes |
| G 064. Lakshman Senewiratne | Yes |
| G 065. Wijith Wijayamuni Zoysa | Yes |
| G 066. D.M. Swaminathan | Yes |
| G 068. Vasantha Senanayake | Yes |
| G 070. Palitha Range Bandara | Yes |
| G 071. M.S. Thowfeek | Yes |

| | |
|---|---|
| G 072. Manusha Nanayakkara | Yes |
| G 073. Sirinal de Mel | Yes |
| G 074. Anura Sidney Jayarathne | Yes |
| G 076. Lakshman Ananda Wijemanne | Yes |
| G 077. A. A. Wijethunga | Yes |
| G 078. Hector Appuhamy | Yes |
| G 081. A. Aravindh Kumar | Yes |
| G 082. Velu Kumar | Yes |
| G 083. Nalaka Prasad Colonne | Yes |
| G 084. Chandima Gamage | Yes |
| G 085. Kavinda Heshan Jayawardana | Yes |
| G 086. Mylvaganam Thilakarajah | Yes |
| G 088. Sujith Sanjaya Perera | Yes |
| G 089. Hirunika Premachandra | Yes |
| G 090. Bandula Lal Bandarigoda | Yes |
| G 091. M. Ibrahim Muhammad Mansoor | Yes |
| G 093. Imran Maharoof | Yes |
| G 094. Ishak Rahuman | Yes |
| G 095. Mujibur Rahuman | Yes |
| G 096. Harshana Rajakaruna | Yes |
| G 097. Thusitha Wijemanna | Yes |
| G 099. Chaminda Wijesiri | Yes |
| G 100. Hesha Withanage | Yes |
| G 101. Sandith Samarasinghe | Yes |
| G 103. Wijepala Hettiarachchi | Yes |
| G 104. Ashu Marasinghe | Yes |
| G 106. Mohamadu Nazeer | Yes |
| G 107. S.M. Mohamed Ismail | Yes |

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ඇ) අනුකූලව මහලේකම්වරයා විසින් පහත සඳහන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පස්දෙනෙකුගේ (05) නම් විමසීමෙන් පහත ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී.

| | |
|---|---|
| G 003. Gamini Jayawickrama Perera | Yes |
| G 069. Field Marshal Sarath Fonseka | Yes |
| G 062. A. H. M. Fowzie | Yes |
| G 049. Faizal Cassim | Yes |
| G 075. K. K. Piyadasa | Yes |

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 117 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 22,300,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 02 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 117 වැඩසටහන 02 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 90,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 02 (මූලධන වියදම)

ශීර්ෂය 117 වැඩසටහන 02 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 175,042,700,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 119

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 119 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 292,465,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 119 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 8,500,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 02 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 119 වැඩසටහන 02 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 270,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 02 (මූලධන වියදම)

ශීර්ෂය 119 වැඩසටහන 02 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 575,600,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අ.භා. 7.06 ට පාර්ලිමේන්තුවට වාර්තා කරනු පිණිස සභාපතිවරයා මූලාසනයෙන් ඉවත්විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2019 අප්‍රේල් 01 සඳුදා.

**6. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015) :** මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,—1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 32(3) වගන්තිය යටතේ 2018.05.23 දින ඉදිරිපත් කරන ලද 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. ශ්‍රී ලංකාවේ ජාතික ඇගයීම් ධාරිතාව සහතික කිරීම පිණිස අධ්‍යයනය කර සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව :** රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය සිය අංක A/RES/69/237, *'රටවල් මට්ටමින්*

*සංවර්ධන ක්‍රියාකාරකම් ඇගයීම පිණිස ධාරිතා වර්ධනය'*, යෝජනාව මඟින් 2015 වර්ෂය සංවර්ධන ක්‍රියාකාරකම් ඇගයීම පිණිස රටවල් වල ධාරිතාව නැංවීමේදී ජාත්‍යන්තර ඇගයීම් වර්ෂය ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ තිබූ හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවේ අමාත්‍ය මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය (NEP), ඇගයීම සඳහා වන ගෝලීය පාර්ලිමේන්තු මන්ත්‍රී සංසදය විසින් 2018 සැප්තැම්බර් 17 දින "වගකියන පාර්ලිමේන්තු: 2030 න්‍යාය පත්‍රය වෙනුවෙන් ඇගයීම ඇතුළත් කර ගැනීම" යන මැයෙන් සංවිධානය කර පවත්වන ලද EvalColombo2018 සම්මන්ත්‍රණයේදී අග්‍රාමාත්‍යවරයා විසින් ආරම්භ කරන ලද හෙයින් ද;

2018 සැප්තැම්බර් 18 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දී අත්සන් තබන ලද කොළඹ ප්‍රකාශනය තුළින් ගිවිස ගන්නා ලද ජාතික ඇගයීම් ප්‍රතිපත්ති සහ යාන්ත්‍රණයක් ඇති කිරීම සඳහා සුදුසු පරිසරයක් හා මඟ පෙන්වීම ලබාදීමට පොරොන්දු වූ හෙයින් ද;

එක්සත් ජාතීන් විසින් සම්මත කර ගන්නා ලද ශ්‍රී ලංකාව අත්සන් කරුවකු වන තිරසර සංවර්ධන ඉලක්ක සන්දර්භය තුළ ඇගයීම වැදගත් බවට පත්ව ඇති හෙයින් ද;

සියළු ගෝලීය හවුල්කරුවන් සහ ආධාර සපයන ආයතන ඔවුන්ගේ සියළු ව්‍යාපෘති සහ වැඩසටහන් ඇගයීමේ රීති සහ මානයන් තුළට සීමා කරගෙන ඇති හෙයින් ද;

සාක්ෂි පාදක නීති සම්පාදන, අයවැයකරණය සහ අධීක්ෂණ කාර්යයන් වෙනුවෙන් අධීක්ෂණ සහ ඇගයීම් යාන්ත්‍රණ වල අදාළ බව සහ අවශ්‍යතාව, නියෝජ්‍ය කථානායකවරයා සභාපතිත්වය උසුලන ඇගයීම සඳහා වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රී සංසදය විසින් සිදු කරන ලද සාකච්ඡා හරහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව හඳුනාගෙන, පිළිගෙන ඇති හෙයින් ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාවට අනුකූලව පාර්ලිමේන්තු ක්‍රියාපටිපාටි හරහා රාජ්‍ය මූල්‍ය හා ජාතික සංවර්ධන මූලාරම්භයන් වෙනුවෙන් අයවැයකරණය සඳහා බලතල පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති හෙයින් ද;

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්, ඇගයීම තුළින් සඵලදායක මුලපිරීම් සහ සංවර්ධන වැඩසටහන් පිළිබඳව යාවත්කාලීන තොරතුරු සහිතව මනාව දැනුවත්ව සිටිය යුතු හෙයින් ද;

ශ්‍රී ලංකාවේ ජාතික ඇගයීම් ධාරිතාව සහතික කිරීම පිණිස අධ්‍යයනය කර පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරනු ලැබිය යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

අ. අදාළ රේඛීය අමාත්‍යාංශ සහ නියෝජිතායතන සමඟ සාකච්ඡා කර ජාතික ප්‍රතිපත්ති සැකසීම සහ නීති සම්පාදනය;

ආ. ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටමේදී ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ නියෝජිතායතන වලට මඟ පෙන්වීම සහ සම්බන්ධීකරණය;

ඇ. ඇගයීමේ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය - පෞද්ගලික සම්බන්ධතාව ධෛර්යමත් කිරීම;

ඈ. දූෂණය, අවකලමණාකරණය සහ නාස්තිය වළක්වාගනිමින්, ඇගයීම තුළින් යහපාලනයේ වටිනාකම් සහ ඇගයීම් තුළින් තීරණ ගැනීම ප්‍රවර්ධනය කිරීම;

ඉ. ප්‍රමාණවත් පරිදි දේශීය සම්පත් වෙන් කිරීම සහ ජාත්‍යන්තර අරමුදල් සම්පත් සොයාගැනීම;

ඊ. කලාපීය සහ ගෝලීය මට්ටමේදී රටවල් අතර විශේෂඥ දැනුම සහ අත්දැකීම් හුවමාරු කර ගැනීම;

උ. පාර්ලිමේන්තුවේ දැනට පවතින අධීක්ෂණ යාන්ත්‍රණය තුළ තිබෙන රාජ්‍ය ගිණුම් කාරක සභාවේ කටයුතු (COPA) සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කටයුතු (COPE) ඇගයීම් දෘෂ්ටියෙන් බලා, එහි ප්‍රතිදානයන් සහ ප්‍රතිඵල පරීක්ෂා කිරීම;

ඌ. ඇගයීම් කාර්යය සඳහා ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවක් ස්ථාපිත කිරීම;

එ. පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක සහ අධීක්ෂණ කටයුතු වලට පහසුකම් සැලසීම සඳහා පාර්ලිමේන්තුවේ පර්යේෂණ ඒකකයේ කටයුතු *'පාර්ලිමේන්තුවේ පර්යේෂණ සහ ඇගයීම් ඒකකය'* ලෙස පුළුල් කිරීම;

ඒ. ජාතික ඇගයීම් ධාරිතාවන් නියාමනය සහ සම්බන්ධීකරණය සඳහා ජාතික ආයතනයක් ස්ථාපිත කිරීම;

ඔ. විද්වතුන්, බුද්ධිමතුන් සහ සංවර්ධන සහ ඇගයීම් වෘත්තිකයන්ගෙන් සමන්විත වන විද්වත් මණ්ඩලයක් සහ ජාල ස්ථාපිත කිරීම; සහ

ඕ. ඉහත කාරණා වලට සම්බන්ධ හෝ ආනුශාංගික සියළු කාරණා සළකා බැලීම.

2. අ. කථානායකවරයා විසින් කාරක සභාව සහ එහි සභාපතිවරයා නම් කළ යුතුය; සහ

ආ. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධානයන්ට අනුව කාරක සභාව සාමාජිකයන් දොළහකට (12) නොවැඩි විය යුතුය.

3. එම කාරක සභාවට,—

අ. සිය ගණපූරණය නියම කර ගැනීමට;

ආ. සිය කාරක සභාව ඉදිරියේ හෝ පාර්ලිමේන්තුව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තකු කැඳවීමට ද, යම් ලේඛනයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද, එවන් පුද්ගලයෙකුගේ පාලනය යටතේ තිබෙන යම්කිසි පත්‍රිකාවක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරිමට ද;

ඇ. කාරක සභාවේ සභාපතිවරයා හෝ ඒ වෙනුවෙන් විශේෂයෙන් බලය ලත් පුද්ගලයෙක් විසින් සිදුකරන දිවුරුම් දීමක් හෝ ප්‍රතිඥා දීමක් මත සාක්ෂිකරුවන් පරීක්ෂා කිරීම සහ සාක්ෂිකරුවන්ගෙන් වාචික පරීක්ෂණ මඟින් ස්ථිර කර ගැනීමට හෝ නිශ්චය කර ගැනීමට;

ඈ. පාර්ලිමේන්තුවෙන් පිටත රටේ ඕනෑම තැනක රැස්වීම් පැවැත්වීමට;

ඉ. කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

ඊ. කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද බලය තිබිය යුතුය.

4. කාරක සභාව තම පළමු රැස්වීම් දිනයේ සිට මාස (06) හයක් ඇතුළත හෝ පාර්ලිමේන්තුව විසින් නියම කරන වෙනත් හෝ වැඩිමනත් කාල සීමාවක් තුළ තම වාර්තාව ඉදිරිපත් කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. කල් තැබීම (රැකියා ලබාදීමේදී බාහිර උපාධිධාරීන් නොසලකා හැරීම) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය යුතුය"යි රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 7.07 ට ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 7.24ට, 2019 මාර්තු 09 වැනි දින සභා සම්මතිය අනුව, 2019 අප්‍රේල් 01 වැනි සඳුදා පූ.භා. 9.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.